Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

කොළඹ, 2021 නොවැම්බර් 7

## නෙස්ටොමෝල්ට් පාපැදි අභියෝගතා තරගාවලිය (2021), රට තුළ ක්‍රීඩා ඉසව් සඳහා ධනාත්මක නව ඇරඹුමක් ලබාදෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ වෘත්තීය පාපැදි තරගකරුවන් 200කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන්, 2021 නෙස්ටමෝල්ට් පාපැදි අභියෝගතා තරඟාවලිය අති සාර්ථක අයුරින් 2021 නොවැම්බර් 7 වැනිදා කොළඹ විහාරමහාදේවී උද්‍යාන පරිශ්‍රයේදී පැවැත්වුණි. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ මෙහෙයවීමෙන් සංවිධානය කෙරුණු මෙම තරඟාවලිය සඳහා නෙස්ටොමෝල්ට් සිය අනුග්‍රහය දැක්වීය. ඒ, ශ්‍රී ලාංකිකයන්ට ධනාත්මක ඇරඹුමක් සහ ජවයෙන් පිරුණු ඉදිරි ගමනක් උදාකරලීමේ සිය අරමුණ අනුව යමිනි.

"වසංගතය පැතිරයාමෙන් අනතුරුව, ක්‍රීඩකයින්ට තරඟවැදීමටත්, සිය ක්‍රීඩා කුසලතා දියුණු කරගැනීමටත් ලැබුණු අවස්ථා ප්‍රමාණය ඉතා සීමිත විය. ඇතැම් විට එවැනි අවස්ථා නොලැබුණු තරම්. එම නිසා, ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සැමවිටම ජනතාවට දිරි දෙන වෙළඳ නාමයක් වශයෙන්, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය සමඟ අත්වැල් බැඳගනිමින්, අපේ දක්ෂ පාපැදි තරගකරුවන්ගේ ඉලක්ක බලගැන්වීමටත්, ඔවුන්ට තමන් ආදරය කරන ක්‍රීඩාව තුළ දක්ෂතා පෙන්වීමට අවස්ථාවක් උදා කරදීමටත් හැකිවීම අපට මහත් අභිමානයක්", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති - කිරි ආහාර නිෂ්පාදන, රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

තරඟකරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් ලබාදී ඇති දැඩි සෞඛ්‍යාරක්ෂණ මාර්ගෝපදේශ අනුගමනය කරමින් සංවිධානය කෙරුණු මෙම තරඟය හරහා, වසංගතය හේතුවෙන් නතර වී තිබුණු මෙරට ක්‍රීඩා ඉසව් හා තරඟ නැවත ආරම්භ කිරීමක් ද සනිටුහන් විය. විශේෂයෙන්ම ජාතික තලයේ මෙන්ම ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟවලට සහභාගී වීමේ අභිලාෂය ඇති ක්‍රීඩකයින්ට තම දක්ෂතාව, ධෛර්යය හා ක්‍රීඩාශීලීත්වය පෙන්නුම් කිරීමට ලැබුණු මහඟු අවස්ථාවක් ලෙස ද මෙය පෙන්වා දිය හැක.

මෙම තරඟාවලිය, පහත දැක්වෙන තරඟ ඉසව් 7න් සමන්විත විය.

තරඟ ප්‍රතිඵල :
පිරිමි විවෘත (කි.මී. 40) – (1) **ඩිල්ෂාන් විජිත කුමාර** (2) **රොෂාන් මධුෂංඛ** (3) **එච්.කේ.එන්.එල්. වංශප්‍රිය**
පිරිමි බාලක (කි.මී. 20) – (1) **එල්.යූ. අවිශ්ක ජයවික්‍රම** (2) **එස්.පී. තරංග ප්‍රනාන්දු** (3) **එල්. දේශාන් කාවින්ද**
කාන්තා විශිෂ්ට කාණ්ඩය – (කි.මී. 20) – (1) **සුදාරිකා ප්‍රියදර්ශනී** (2) **මධුමාලි ප්‍රනාන්දු** (3) **ඈන් ෂෙනාලි**
පිරිමි අවුරුදු 23න් පහළ (කි.මී. 50) – (1) **ෂෙහාල් චමෝද් ද සිල්වා** (2) **සුපුන් පියුමාල්** (3) **දිනේෂ් චමීර**
පිරිමි විශිෂ්ට කාණ්ඩය (කි.මී. 50) – (1) **නිරාන් පසිඳු** (2) **අවිශ්ක මැඩොන්සා** (3) **නිදුෂ් නිරන්ත**
පිරිමි අවුරුදු 40 ඉහළ (කි.මී. 20) – (1) **ප්‍රසන්න මැඩොන්සා** (2) **සුරේෂ් දුලංක** (3) **ඩබ්.ඩී. රෝහිත**
පිරිමි අවුරුදු 50 ඉහළ (කි.මී. 20) – (1) **මොහොමඩ් මුනාෆ්** (2) **සුසන්ත නන්දලාල්** (3) **එම්. රන්ජිත් ජයලාල්**

නෙස්ලේ යනු වසර 115ක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට සමීපව කටයුතු කරන සමාගමකි. නෙස්ලේ ලංකා සමාගම සතු ප්‍රමුඛතම සන්නාමය වන *නෙස්ටොමෝල්ට්* යනු වසර 50කටත් වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල් රසවිඳින, ඔවුන්ගේ විශ්වාසය දිනාගත් වෙළඳ නාමයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන *නෙස්ටොමෝල්ට්* ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් පානය වන අතර, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, අත්‍යවශ්‍ය පෝෂක රැසකින් ද ශරීරයත් මනසත් බලගන්වයි.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |